# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2082/35 - 2018 අගෝස්තු මස 01 වැනි බදාදා - 2018.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/22/26/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.02.27 දිනැති හා අංක 1799/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.02.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, මඩපාත, සපුමල් පෙදෙස, අංක 200/7හි පදිංචි ඒ. ඩී. ඒ. අමරසිංහ මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, වොක්ෂෝල් වීදිය, ජ.න.ව.ස.ම. ගොඩනැගිල්ල, අංක 55/75හි පිහිටි සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය : IR/22/26/2011.

**කාර්මික අධිකරණයේ දී ය.**

ඒ. ඩී. ඒ. අමරසිංහ මහතා,
200/7, සපුමල් පෙදෙස,
මඩපාත,
පිළියන්දල.

නඩු අංකය : ඒ / 3499

*ඉල්ලුම්කරු*

*එරෙහිව*

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය,
අංක 55/75, ජ.න.ව.ස.ම. ගොඩනැගිල්ල,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

වගඋත්තරකරු

යන දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරාවුල පිළිබඳවයි.

**ප්‍රදානයයි**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2013.02.18 දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර වූ කාර්මික ආරාවුලට හේතු වී පැවති කරුණ වූයේ -

**''සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් සේවයේ නියුතුව සිටි ඒ. ඩී. ඒ. අමරසිංහ මහතා හට වයස අවුරුදු පනස් හත (57) දක්වා සේවය කිරීමට තිබූ අවස්ථාව අහිමි කරමින් වයස අවුරුදු පනස් තුනේදී (53) විශ්‍රාම ගැන්වීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවෙන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''**

දෙපාර්ශ්වය ම විසින් තමන් තමන්ගේ මුල් ප්‍රකාශයෙනුත් පිළිතුරු ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව සමථයකට එළඹීමට නොහැකි වීම මත ඒ බව වාර්තා කොට 2014.01.10 දින විමසුම ආරම්භ කරන ලදී.

ඒ කෙසේ වුවද විමර්ශණය අතරමගදී පාර්ශ්වයන් සමථයකට එළඹෙන ලදී.

ඒ අනුව දේශපාලන කම්ටුවෙන් රු. 45,000/-ක මුදලක් ඉල්ලුම්කාර සේවක පාර්ශ්වයට යෝජනා වී තිබුණු මුදලට අමතරව තවත් රු. 55,000/-ක මුදලක් වගඋත්තරකාර සේවා යෝජක පාර්ශ්වය ගෙවීමට එකඟව රු. 100,000/-ක මුදලක් සඳහා පූර්ණ හෝ අවසානාත්මක සමථයකට එළඹ එකී මුදල ලබාගෙන ගොනුවට 2016.11.20 දින අත්සන් තබන ලදී.

ඒ ආකාරයෙන් මෙම කාර්මික ආරාවුල අවසන් වීම සාධාරණ සහ යුක්තිසහගත බැවින් සමථයකට පත් කරමි.

එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

2018 පෙබරවාරි මස 28 වැනි දින.

08 - 558

මගේ අංකය : IR/COM/03/Q/2014/43.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.03.31 දිනැති හා අංක 1908/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.03.19 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, වීර මාවත, අංක 67/5/බී හි පදිංචි සුරේබා කන්නන්ගර මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, යෝර්ක් වීදිය, අංක 60හි පිහිටි ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය : IR/COM/03/Q/2014/43.

**කාර්මික අධිකරණයේ දී ය.**

සුරේබා කන්නන්ගර මිය,
අංක 67/5/B,
වීර මාවත,
පන්නිපිටිය.

නඩු අංකය : ඒ / 3597

*ඉල්ලුම්කරු*
*එරෙහිව*

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය,
අංක 60,
යෝර්ක් වීදිය,
කොළඹ 01.

*වගඋත්තරකරු*

යන දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳවයි.

**ප්‍රදානයයි**

අධිකරණ හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා වෙත පැවරී ඇති බලතල අනුව වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2015.03.19 දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත පාර්ශ්වයන් අතර කාර්මික ආරවුලට හේතු වී පැවති කරුණ වූයේ -

**''ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ විගණන සහකාරවරියක් ලෙස සේවය කළ සුරේකා කන්නන්ගර මහත්මියගේ සේවය අවසන් වීමේදී, 2003.05.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED 10 වන්දි යෝජනා ක්‍රමය පදනම් කර ගනිමින් වන්දි මුදල් ලැබීමට හිමිකම් තිබේද යන්න සහ එලෙස හිමිකමක් තිබේ නම්, ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''**

දෙපාර්ශ්වය විසින් තම තමන්ගේ ප්‍රකාශයෙන් ගොනු කිරීමෙන් අනතුරුව 2018.08.24 වැනි දින විමර්ශනය ආරම්භ කර ඇත.

ඒ කෙසේ වුවද විමර්ශනය අතරමගදී සමථයකට එළඹෙන ලදී.

ඒ අනුව ඉල්ලුම්කාර සේවක පාර්ශ්වය PED 10 චක්‍රලේඛය අනුව ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත් වන අවස්ථාවේදී රුපියල් ලක්ෂ 5ක (රු. 500,000/-)ක් ගෙවිය යුතු බවටත් දැනටමත් ගෙවා ඇති රුපියල් එක් ලක්ෂ හැට තුන්දහස් දෙසිය හැත්තෑ එකයි ශත පනහයි (රු. 163,271.50) මුදලින් ඉතිරි මුදල වන රුපියල් තුන් ලක්ෂ තිස් හය දහස් හත්සිය විසි අටයි ශත පනහ (රු. 336,728.50)ක මුදලක් පූර්ණ හා අවසානාත්මක සමථයක් වශයෙන් ගෙවීමට එකග වී එකී මුදල චෙක්පතකින් ගෙවා එකී චෙක්පත ලබාගෙන ගොනුවට 2017.01.19 වන දින අත්සන් තබන ලදී.

එසේම කර්මාන්ත වාණිජ කටයුතු අමාත්‍යාංශය හෝ හස්ත කර්මාන්ත මණ්ඩලය යම් අමතර මුදලක් PED 10 චක්‍රලේඛය යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය අයට ගෙවීමට තීරණය කරනු ලැබුවහොත් මෙකී සමථය එකී මුදල ලබා ගැනීමට බාධාවක් නොවන බවට දෙපාර්ශ්වයම එකග වන ලදී.

එකී කොන්දේසි මත මේ ආකාරයෙන් මෙම කාර්මික ආරවුල අවසන් වීම සාධාරණ හා යුක්ති සහගත බැවින් සමථයකට පත්කරමි.

එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

2018 පෙබරවාරි මස 28 වැනි දින.

08-559

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.